# 1.25 සංගීත මෘදුකාංග භාවිතය මගින් කලාකරුවාගේ අනන්‍යතාවයට සහ වෘත්තීය අවස්ථා වලට ඇති වන බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක්

ජී.ඩී. සුජිත් ප්‍රියදර්ශන
දෘශ්‍ය කලා සැලසුම්කරණ හා ප්‍රාසංගික කලා ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

---

## ABSTRACT

පසුගිය දශකය පමණ කාලයේදී ශ්‍රී ලංකා සංගීත ක්ෂේත්‍රයේ පරිඝනක සංගීත මෘදුකාංග ආධාරයෙන් සංගීත නිර්මාණ කිරීමේ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. මේ හේතුවෙන් සංගීත ශාස්ත්‍රමය වශයෙන් ඇති ශිල්පීයාගේ අනන්‍යතාව සහ වෘත්තීමය අවස්ථා විශාල ලෙස පසුබෑමකට ලක්ව ඇති බව නිරීක්ෂණය කළ හැකි විය. මෙමගින් සංගීත ශාස්ත්‍රය සහ ශිල්පියාට සිදුවිය හැකි බලපෑම් පිළිබඳව අධ්‍යයනය කරන ලදී. මෙහිදී සංගීත පරිඝනක මෘදුකාංග වල ගුණාංග අධ්‍යයනය කරන ලද අතර ශබ්දාගාර ආශ්‍රිත විමර්ශන මෙන්ම සංගීත වේදීන් හා සමග කරන ලද සාකච්ජා මගින් කරුණු සොයා බලන ලදී. මෙම අධ්‍යයනයෙන් පෙනී ගිය ප්‍රධානම කරුණක් වූයේ දෘශ්‍යමාන නාද තරංග වල කම්පන කාලය (time or tempo), කම්පනයේ ප්‍රබලතාවය (amplitude or volume), තරංග යේ කම්පන වාර සංඛ්‍යාව (frequency or pitch), මෘදුකාංග ගත තාක්‍ෂණයෙන් වෙනස් කිරීම මගින් සහ මෘදුකාංග තුළ අන්තර්ගත පූර්ව සූදානම් සංගීත නාද , සංගීත කණ්ඩ ආධාරයෙන් කරන ලද නිර්මාණ හේතුවෙන් කලාකරුවාට ඇති අවස්ථා ගිලිහි යාම, ඔවුන් සතු කුශලතාවන් භාවිතයෙන් ඈත් වීම ආදී කරුණු, උක්ත ගැටළුවට හේතු සාදක වී ඇති බව බවය.